මහජන ආරක්ෂක අමාත්‍යාංශය
பொதுமக்கள் பாதுகாப்பு அமைச்சு
MINISTRY OF PUBLIC SECURITY

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
ஆட்களைப் பதிவு செய்யும் திணைக்களம்
DEPARTMENT FOR REGISTRATION OF PERSONS

10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.
10 ஆம் மாடி,சுஹுருபாய, ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை.
10th Floor, Suhurupaya, Sri Subhuthipura rd, Battaramulla.

මගේ අංකය / எனது இல. / My Ref. DRP/OP/02/School/05
ඔබේ අංකය / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2024.01.17

"විශ්වසනීය පුද්ගල අනන්‍යතාව හැඳුනුම්පතයි" "அடையாள அட்டை - நம்பகத்தன்மையான தனிநபர் அடையாளம்" "Identity Card, the Trusted Personal Identity"

පරිවෙණාධිපති / විදුහල්පති,

..............................................

..............................................

**2024/2025 වර්ෂවල අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටින අපේක්ෂකයන් වෙනුවෙන් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ විශේෂ වැඩපිළිවෙල**

පසුගිය වර්ෂයන්හි අ.පො.ස. (සා.පෙළ) විභාග අපේක්ෂකයන්ගේ ජාතික හැඳුනුම්පත් ලබා දීමේ විශේෂ වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා ඔබ දැක්වූ සහයෝගය ඉතා අගය කොට සලකන අතර, එහිදී දක්නට ලැබුණු අඩුපාඩු හා දෝෂ අවම කර ගනිමින් මෙවර ද පාසල් සිසුන් සඳහා කල්වේලා ඇතිව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ විශේෂ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

02. 1968 අංක 32 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව අ.පො.ස. (සා.පෙළ) සිසුන් ඉගෙනුම ලබන සියලුම රජයේ පාසල් වල හා රජයේ අනුමත පෞද්ගලික පාසල් වල විදුහල්පතිවරුන් හා පිරිවෙන් වල පරිවෙණාධිපතිවරුන් "සහතික කිරීමේ නිලධාරීන්" ලෙස පත්කර ඇති බැවින්, ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට අදාල කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම ඔබ වෙත පැවරෙන වගකීමකි. සහතික කිරීමේ නිලධාරීන් ලෙස තමන්ට පැවරී ඇති වගකීම නිසි ලෙස ඉටු කරමින්, පාසල් සිසුන්ට අපහසුවකින් තොරව ජාතික හැඳුනුම්පත ලබා ගැනීමට අවස්ථාව සලසා දීම රාජකාරිමය බැඳීමක් ඉටු කිරීමක් පමණක් නොව රටේ අනාගතය භාර ගැනීමට සිටින දරු පරපුර වෙනුවෙන් තම යුතුකම් ඉටු කිරීමක් ද වන බව සිහිපත් කිරීමට කැමැත්තෙමි.

03. 2016 අංක 08 දරණ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන හා **වයස අවුරුදු පහළොවට එළඹ ඇති හෝ එළඹෙන** සෑම තැනැත්තෙක්ම ලියාපදිංචියට යටත් වේ. ඒ අනුව 2025 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත සියලුම සිසුන්ට ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබී ඇති බැවින් ඔබ පාසලේ/පිරිවෙනේ ඉගෙනුම ලබන **2025 වර්ෂයේ දී අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත 2009.02.01 දින සිට 2010.01.31 දින අතර කාලය තුල උපන් සියලුම සිසුන්ගේ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2024.03.31 දිනට පෙර පහත දැක්වෙන පරිදි පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පළාත් කාර්යාල වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කළ යුතුය.** එසේම 2024 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටීමට නියමිත **2008.02.01 සිට 2009.01.31 දින දක්වා කාලය තුල උපන් මෙතෙක් ජාතික හැඳුනුම්පත සඳහා ඉල්ලුම් කර නොමැති** සිසුන්ගේ ඉල්ලුම්පත් ද කඩිනමින් යොමුකරන ලෙස දන්වන අතර, එමගින් වයස අවුරුදු 16 එළඹීම මත ගෙවීමට සිදුවන උචිත නියමිත කාලය තුල ජාතික හැඳුනුම්පත ලබා නොගැනීම නිසා අයකරනු ලබන ප්‍රමාද ගාස්තු ගෙවීම වළක්වා ගත හැකි වේ.

දුරකථන / தொலைபேசி / Telephone (011) 5226100
ෆැක්ස් / பெக்ஸ் / Fax (011) 2862198
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail info@drp.lk
වෙබ් / இணையதளம் / Web www.drp.gov.lk

| පාසල/පිරිවෙන පිහිටි පළාත | උතුරු පළාත | නැගෙනහිර පළාත | වයඹ පළාත | දකුණු පළාත | උතුරු, නැගෙනහිර, වයඹ හා දකුණු පළාත් හැර අනෙකුත් සියලුම පළාත් |
|---|---|---|---|---|---|
| ඉල්ලුම්පත් යොමු කළ යුතු ලිපිනය | සහකාර කොමසාරිස්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු උතුරු පළාත් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, වව්නියාව. | නියෝජ්‍ය කොමසාරිස්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු නැගෙනහිර පළාත් කාර්යාලය, මඩකලපුව. | නියෝජ්‍ය කොමසාරිස්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු වයඹ පළාත් කාර්යාලය, 3 වන මහල, නව වෙළඳ සංකීර්ණය, කුරුණෑගල. | සහකාර කොමසාරිස්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු දකුණු පළාත් කාර්යාලය, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගාල්ල. | කොමසාරිස් ජනරාල්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 10 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල. |

04. පාසල් සිසුන්ට ජාතික හැඳුනුම්පත් ලබා දීමේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස ද කාරුණිකව දන්වමි.

I. ලියාපදිංචි වීම සඳහා පු.ලි.දෙ.වි 1,7,8 ඉල්ලුම්පතින් පමණක් ඉල්ලීම් කළ යුතු අතර අවශ්‍ය ඉල්ලුම්පත් පාසල/පිරිවෙන අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හෝ පළාත් කාර්යාල මගින් ලබාගත හැකිය. ඊට අමතරව www.drp.gov.lk යන දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවියෙන් ද ඉල්ලුම්පත් බාගත කර ගත හැකිය.

II. සෑම ඉල්ලුම්පතක්ම ක්ෂණික ප්‍රතිචාර කේතයක් (QR Code) අලවා වලංගු කළ යුතුය. මෙම ක්ෂණික ප්‍රතිචාර කේත පාසල/පිරිවෙන පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථාපිත කොට ඇති පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු ඒකකයෙන් ලබාගත යුතුය. එහිදී, ඔබ වෙත ලබාදෙන QR කේත පත්‍රයක, **<u>QR කේත යුගල 50 ක්</u>** අඩංගු වන අතර, මෙම එක් QR යුගලයක් එක් ඉල්ලුම්පතක් සඳහා පමණක් භාවිතා කළ යුතුය. මෙහිදී, QR කේත යුගලයකින් එක් කේතයක් ඉල්ලුම්පතේ අදාල ස්ථානයේ ඇලවිය යුතු අතර, අනෙක් QR කේතය ඉල්ලුම්කරුට ලබාදෙන කොටසෙහි (ඉල්ලුම්පතේ තුන්වන කොටසෙහි) අලවා ඉල්ලුම්කරුට භාරදිය යුතුය. **<u>ඉල්ලුම්පත පිළිබඳව ඉදිරි විමසීම් කිරීම සඳහා එය අත්‍යාවශ්‍ය වේ.</u>** (ක්ෂණික ප්‍රතිචාර කේත භාවිතය හා ගබඩා කිරීම සම්බන්ධයෙන් ඔබ වෙත නිකුත් කර ඇති මගේ අංක DRP/OP/01/New.App./ 43 හා 2016.02.23 දරණ ලිපියෙහි උපදෙස් අනුව කටයුතු කළ යුතු වේ)

III. සෑම ඉල්ලුම්පතකම පළමු පිටුවේ ඉහළ වම් කෙලවරෙහි **පාසලේ නම හා දුරකථන අංකය** පැහැදිලිව සටහන් කළ යුතු ය. (ඉල්ලුම්පතෙහි පවතින අඩුපාඩු ක්ෂණිකව දැනුම් දීමට මෙය ඉතා වැදගත් වේ.)

IV. ඉල්ලුම්පතේ පළමු පිටුවේ "දිස්ත්‍රික්කය", "ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය", "ග්‍රාම නිලධාරී අංකය හා කොට්ඨාසය" අනිවාර්යෙන් සඳහන් කල යුතු අතර එහි සඳහන් කළ යුත්තේ **ඉල්ලුම්කරුගේ ස්ථිර පදිංචි ලිපිනය අයත් වන දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකයයි.** <u>කිසිවිටෙකත් පාසල පිහිටා ඇති ප්‍රදේශයට අදාල විස්තර ඒ යටතේ සඳහන් නොකළ යුතු ය.</u>

V. ඉල්ලුම්පත පැහැදිලි අකුරින් සම්පූර්ණ කළ යුතු ය

**නම -**

ඉල්ලුම්කරු විසින් උප්පැන්න සහතිකයේ 2 වන තීරුවෙහි සඳහන්ව ඇති නම සම්පූර්ණයෙන්ම භාවිතා කළ යුතු අතර, ඊට අමතරව පෙළපත් නාමය හෝ පියාගේ නමේ අගට යෙදෙන වාසගම **ඉල්ලුම්කරුගේ අභිමතය** පරිදි භාවිතා කිරීම සිදුකළ හැකිය.

උදා:-

| | | |
|---|---|---|
| උප්පැන්න සහතිකයේ දෙවන තීරුවේ සඳහන් නම | : | කසුන් සමීර |
| පියාගේ නම | : | සිරිපාලගේ සරත් කුමාර පෙරේරා |
| ලබාදිය හැකි නම් | : | කසුන් සමීර |
| | : | සිරිපාලගේ කසුන් සමීර |
| | : | සිරිපාලගේ කසුන් සමීර පෙරේරා |
| | : | කසුන් සමීර පෙරේරා |

නම සටහන් කිරීමේදී ඉල්ලුම්කරුගේ මව් භාෂාවෙන් (සිංහල හෝ දෙමළ) ඉල්ලුම්පතේ පළමු පිටුවේ අංක 1 හි සහ ඉංග්‍රීසි භාෂාවෙන් අංක 2 හි සටහන් කළ යුතුය. මෙහි දී ඉල්ලුම්කරු ඉංග්‍රීසි භාෂාවෙන් නම ලිවීම සඳහා භාවිතා කරනු ලබන අක්ෂර වින්‍යාසය අනුව ඉල්ලුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් ලබාදිය යුතුය. ඉංග්‍රීසි භාෂාවෙන් නම සටහන් නොකරන ඉල්ලුම්කරුවන් සඳහා ලබාදී ඇති නම ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය වීමේ දී සිදුවන අක්ෂර වින්‍යාස දෝෂ හැඳුනුම්පත් නිකුත් කිරීමෙන් පසුව වෙනස් කළ නොහැක. **එබැවින්, ඉංග්‍රීසි භාෂාවෙන් නම සඳහන් කිරීම අනිවාර්යය වේ.**

**ලිපිනය -**

පාසල / පිරිවෙන සතුව ඇති තොරතුරු මගින් තහවුරු වී ඇති ලිපිනය භාවිතා කළ යුතු අතර, <u>**එසේ නොවන අවස්ථා වලදී**</u> ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන පදිංචි සහතිකය මගින් හෝ මේ සමඟ ඇති ආකෘතිය(ඇමුණුම I) මගින් ලිපිනය තහවුරු කර ගත හැකිය.

ඉල්ලුම්කරුගේ ලිපිනය සටහන් කිරීමේදී ඉල්ලුම්කරුගේ මව් භාෂාව (සිංහල හෝ දෙමළ) සහ ඉංග්‍රීසි භාෂාව යන භාෂා ද්විත්වයෙන් ම නිවැරදි සම්පූර්ණ ලිපිනය සඳහන් කළ යුතු ය. ජාතික හැඳුනුම්පතේ විස්තර ත්‍රෛභාෂාවෙන් මුද්‍රණය කරන බැවින් තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීම සඳහා මෙය අත්‍යවශ්‍ය වන බව සැලකිය යුතු ය. <u>තවද කිසි විටකත් ඉල්ලුම්කරුගේ ලිපිනය ලෙස පාසලේ ලිපිනය සඳහන් නොකළ යුතු ය.</u>

VI. ඉල්ලුම්පතේ තුන්වන පිටුවේ අංක 11- "විමසීම් සඳහා අවශ්‍ය තොරතුරු" යටතේ ඉල්ලුම්කරුගේ හෝ ඉල්ලුම්කරුගේ දෙමාපියන්ගේ/භාරකරුගේ දුරකථන අංකය පැහැදිලිව සටහන් කළ යුතුය. (ඉල්ලුම්කරුගෙන් විමසීම් කළ යුතු අවස්ථා වලදී ඉල්ලුම්කරු ක්ෂණිකව සම්බන්ධ කර ගැනීමට මෙය ඉතා වැදගත් වේ.)

VII. ඉල්ලුම්පත සමඟ ඉල්ලුම්කරුගේ <u>උප්පැන්න සහතිකයේ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් සහතික කළ පැහැදිලි මුල් පිටපතක් අමුණා එවිය යුතුය.</u> එසේ ලබා ගන්නා උප්පැන්න සහතිකයේ නම/උපන් දිනය, උපන් ස්ථානය පැහැදිලිව සඳහන්ව තිබේදැයි පරීක්ෂා කල යුතුය.එම මුල් පිටපත් ආපසු ඉල්ලුම්කරු වෙත එවනු නොලැබේ. තවද උපත ලියාපදිංචි කිරීම සඳහා දැනුම් දෙන ලද මුල් අවස්ථාවේ අදාල වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරයා හෝ ග්‍රාමීය රෙජිස්ට්‍රාර්වරයා විසින් "නොමිලේ නිකුත් කරන ලද පිටපත" හෝ උපුටා ගන්නා ලද සටහන සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති උප්පැන්න සහතිකයේ තොරතුරු පරස්පර වන අවස්ථා නිරීක්ෂණය වී ඇති බැවින්, මෑතකදී ලබාගන්නා ලද උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

VIII. ඉල්ලුම්කරු විදේශයක දී උපත ලබා ඇත්නම් එම උපත පුරවැසිභාවය පිළිබඳ පනතේ 5(2) වගන්තිය ප්‍රකාරව ලියාපදිංචි කර ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන පුරවැසි සහතිකයේ **ඡායා පිටපතක්**, මුල් පිටපත සමග සසඳා බලා විදුහල්පති/පරිවේණාධිපති විසින් සහතික කර ඉදිරිපත් කළ යුතු ය. (කිසි විටෙකත් මෙම සහතිකයේ මුල් පිටපත ඉල්ලුම්පත සමග අමුණා එවීම නොකළ යුතුය)

IX. ජාතික හැඳුනුම්පතට යොදා ගනු ලබන ඡායාරූපය සඳහා අදාල ඡායාරූප ශාලාව මගින් ලබාදෙන ඉල්ලුම්කරුගේ ඡායාරූපය සහිත කුවිතාන්සියෙහි ඡායාරූප ශාලා හිමිකරු අත්සන් කර තිබිය යුතු අතර, ඉල්ලුම්කරු විදුහල්පති/පරිවේණාධිපති ඉදිරියේදී අත්සන් කිරීමෙන් අනතුරුව විදුහල්පති/පරිවේණාධිපති විසින් තම අත්සන තබා නිල මුද්‍රාව තැබිය යුතුය. ඡායාරූපය මාස 06 ක කාලයකට පමණක් වලංගු වේ. **එසේම, ඉල්ලුම්කරුවෙකු යම් ආබාධිත තත්ත්වයකින් පසුවන්නේ නම් ඒ පිළිබඳව විදුහල්පති/පරිවේණාධිපති විසින් ඡායාරූප සහිත කුවිතාන්සියෙහි ඉල්ලුම්කරුගේ ආබාධිත තත්ත්වය පිළිබඳව සටහන් කර එය සහතික කර ඉදිරිපත් කළ යුතුය.**

X. ඉල්ලුම්පත්‍රය ඉල්ලුම්කරු විසින් අත්සන් කර තිබිය යුතු ය. ඉල්ලුම්කරුගේ අත්සන අදාල ශිෂ්‍යයා විසින්ම තැබිය යුතු අතර, එය ජාතික හැඳුනුම්පතෙහි මුද්‍රණය කරන බැවින්, ඉල්ලුම්පතෙහි 4 වන පිටුවේ ඒ සඳහා වෙන් කර ඇති කොටුවේ සීමා ඉරි වල ස්පර්ශ නොවන පරිදි හා පහළ සීමා ඉරට සමාන්තර වන ලෙස **තද කළු පැහැ වර්ණ සහිත පෑනක්** භාවිතා කොට අත්සන තැබිය යුතුය. පසුගිය වර්ෂ වල ඉදිරිපත් වූ බොහෝ පාසල් ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත්‍රයේ එක් භාෂාවකින් ද ඡායාරූප කුවිතාන්සියේ වෙනත් භාෂාවකින් ද අත්සන් තබා ඇති බව නිරීක්ෂණය වූ බැවින් ඉල්ලුම්කරුගේ අත්සන **සෑම ස්ථානයකම එකම ආකාරයකින්** තැබීමට වගබලා ගත යුතුය.

XI. සහතික කිරීමේ නිලධාරියා ලෙස විදුහල්පති/පරිවේණාධිපති විසින් ඉල්ලුම්පතේ 4 වන පිටුවේ නියමිත ස්ථානයෙහි තම නම ලියා, අත්සන් කර නිල මුද්‍රාව පැහැදිලිව තැබිය යුතු ය. **නිල මුද්‍රාව කියවිය නොහැකි සේ, බොඳ වීමෙන් අපැහැදිලි වන සේ හෝ නියමිත පරිදි තීන්ත නොයෙදීම නිසා ළා පැහැති වර්ණයෙන් යුතු වන සේ තැබීමෙන් ඉල්ලුම්පත ප්‍රතික්ෂේප විය හැකි බැවින් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.**

XII. ජාතික හැඳුනුම්පත ලබාගැනීම සඳහා මුල්වරට ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුවන්ට අදාළ **ඉල්ලුම්පත් ගාස්තුව රු.200/- ක්** වන අතර, වර්තමානයට අදාළවන ලියාපදිංචි තැපෑලෙන් ජාතික හැඳුනුම්පත යොමු කිරීම සඳහා වන ගාස්තුව රු.120/- ක් ද ගෙවිය යුතු ය. ඒ අනුව **මුළු ගාස්තුව රු.320/- (200+120) කි.** එම ගාස්තු ගෙවීමේ දී මගේ අංක DRP/OP/01/Charges -Amm/33(volume II) හා 2022.10.18 දිනැති ලිපියෙහි උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ.

XIII. **උචිත නියමිත කාලය (වයස අවුරුදු 15 එළඹෙන දින සිට අවුරුදු 16 එළඹෙන තෙක් වූ වසරක කාලය) තුල ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් යොමු නොකිරීමේ වරද සමථයට පත්කර ගැනීම සඳහා රු.2500/- ක දඩ මුදලක් ගෙවිය යුතු වේ. ඒ සඳහා සම්පූර්ණ කරන ලද පු.ලි.දෙ/මෙ/02/03/ii ආකෘතිය සහ රු. 2500/- ක මුදලක් *දිවයිනේ ඕනෑම* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට *අදාල ඉල්ලුම්කරුගේ නමින්* මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය.**

- **නියමිත වයස් සීමාව තුලදී (වයස අවුරුදු 15 එළඹෙන දින සිට අවුරුදු 16 එළඹෙන තෙක් වූ වසරක කාලය දක්වා) ජාතික හැඳුනුම්පත සඳහා ඉල්ලුම් කිරීම මගින් ඉහත දඩ මුදල් ගෙවීම වළක්වා ගත හැකිය.**

- ***යම් ඉල්ලුම්කරුවෙකුගේ වයස අවුරුදු 16 සම්පූර්ණ වන දිනට පෙර විදුහල්පති විසින් හැඳුනුම්පත් ඉල්ලුම්පත සහතික කර ඇත්නම්, එය උචිත නියමිත කාලය තුල ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පතක් ලෙස සලකනු ලබන අතර ඒ සඳහා දඩ මුදල් අයකිරීමක් සිදු නොකෙරේ.***

XIV. මුදල් ගෙවීම හා පරීක්ෂා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉල්ලුම්පත් භාර දීමේදී, **පුලිදෙ/මෙ/ප්‍රා/14 ආකෘති පත්‍රය පිටපත් 03 කින් සම්පූර්ණ කර**, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හැඳුනුම්පත් අංශය වෙත එක් පිටපතක් ලබා දීමටත්, දෙවන පිටපත ඉල්ලුම්පත් සමඟ දෙපාර්තමේන්තුව වෙත එවීමටත් කටයුතු කළ යුතු අතර, තෙවන පිටපත විමසීම් හා පරීක්ෂා කිරීම් සඳහා ඔබ භාරයේ තබා ගත යුතු වේ.

XV. පාසල් / පිරිවෙන් සිසුන්ගේ ඉල්ලුම්පත් පිළිබඳව යම් ගැටළුවක් වේ නම් ඒ පිළිබඳව දුරකථන අංක **0115226100** ඔස්සේ පරිපාලන නිලධාරි (මෙහෙයුම්) හෝ **0112862985** ඔස්සේ පාසල් ඉල්ලුම්පත් සම්බන්ධීකරණ නිලධාරී අමතන ලෙස කාරුණිකව දන්වමි.තව ද වැඩිදුර විස්තර www.drp.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

06. ඉහත කරුණු කෙරෙහි දැඩි අවධානය යොමු කරමින් ඔබ පාසලේ/පිරිවෙනේ ඉගෙනුම ලබන මෙතෙක් ජාතික හැඳුනුම්පත සඳහා ඉල්ලුම් කර නොමැති, සියලුම සිසුන්ගේ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2024.03.31 දිනට පෙර **ඉහත අංක 03 ඡේදයේ දක්වා ඇති පරිදි** පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු පළාත් කාර්යාල වෙත හෝ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එසේ ඉල්ලුම්පත් යොමු කිරීම තුළින් නියමිත පරිදි පාසල් / පිරිවෙන් සිසුන් සඳහා ජාතික හැඳුනුම්පත් ලබා දීමට හැකි වන බව සිහිපත් කරනු කැමැත්තෙමි.

07. මෙම කාර්ය සාර්ථක කර ගැනීම සඳහා ඔබ ලබාදෙන සහයෝගය බෙහෙවින් අගය කරමි.

**ජී.ප්‍රදීප් සපුතන්ත්‍රි**
පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්

පිටපත්:

| | | |
|---|---|---|
| 01. | ලේකම්, මහජන ආරක්ෂක අමාත්‍යාංශය | -කරු. දැ.ගැ.පි. |
| 02. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය | -කරු. දැ.ගැ.පි. |
| 03. | ලේකම්, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | -කරු. දැ.ගැ.පි. |
| 04. | සියලුම දිස්ත්‍රික් ලේකම්වරු | -කරු. දැ.ගැ.පි. |
| 05. | විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව | -කරු. දැ.ගැ.පි. |
| 06. | සියලුම ප්‍රාදේශීය ලේකම්වරු | -කරු.දැ.ගැ.පි.සහ අ.ක.ස. |
| 07. | සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු | -කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස. |
| 08. | සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු | -කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස. |
| 09. | සියලුම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු | -කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස. |
| 10. | පු.ලි.දෙ. පළාත් සහකාර කොමසාරිස්වරු | -කරු. දැ.ගැ.පි. |
| 11. | සියලුම මාණ්ඩලික නිලධාරීන් | -කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස. |
| 12. | පු.ලි.දෙ. ප්‍රාදේශීය ඒකකයන්ට අනුයුක්ත සංවර්ධන නිලධාරීන් | -කරු.දැ.ගැ.පි. සහ අ.ක.ස. |

**උචිත නියමිත කාලය තුළ ජාතික හැඳුනුම්පතක් ලබාගෙන නොමැති බවටත්, ඒ සඳහා ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත්කර නොමැති බවටත් කරන ප්‍රකාශය**

දිස්ත්‍රික්කය :....................................... පාසලේ නම : ............................................................

ඉල්ලුම්පත්‍ර අංකය :.................................

01 ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම: ......................................................................................................
...........................................................................................................................................

02. ලිපිනය: ......................................................................................................................
...........................................................................................................................................

03. උපන් දිනය: ......................................................................................................................

04. මෙතෙක් නියමිත කාල සීමාව තුළ ලියාපදිංචි වී ජාතික හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා ඉල්ලුම්පත්‍රයක් යොමු නොකිරීමට හේතු

- උප්පැන්න සහතිකය /අනුමාන වයස් සහතිකය/ හෝ උපන් දිනය සනාථ කරන ලේඛන නොමැතිවීම
- වයස 16 සම්පූර්ණ වුවත් දිගු කලක් විදේශ රටක ජීවත්වීම
- ප්‍රමාදවී ලංකාවේ පුරවැසිභාවය ලබාගැනීම
- වෙනත් හේතු
- .......................................................................................................
.............................................................................................................................

05. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 8 වෙනි වගන්තිය ප්‍රකාරව උචිත නියමිත කාල සීමාව තුල ලියාපදිංචි වී ජාතික හැඳුනුම්පතක් ලබාගැනීම පැහැර හැරීම පනතේ 44 (1) අ වගන්තිය ප්‍රකාරව වරදක් බවත්, එම වරද සමථයකට පත්කිරීම සඳහා නියමිත ගාස්තු ගෙවීමට එකඟ වන බවත්, මෙයින් ප්‍රකාශ කර සිටිමි.

06. මීට පෙර ඉල්ලුම්පත්‍රයක් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යොමුකර ජාතික හැඳුනුම්පත මෙතෙක් ලැබී නොමැති නම්

i. ඉල්ලුම්පත්‍ර අංකය: .........................................................
ii. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය: ........................................
iii. දිස්ත්‍රික්කය: ...................................................................
iv. ඉල්ලුම්පත්‍රය යොමුකළ දිනය: ...........................................

ඉහත මා විසින් සඳහන් කරන ලද කරුණු සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

ප්‍රකාශය කරන ස්ථානය: ..................................... දිනය: ..............................

................................................
**ඉල්ලුම්කරුගේ අත්සන**

ඉහත සඳහන් වරද සඳහා රු. .............. ගාස්තුවක් වරද සමථයකට පත්කිරීම සඳහා නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

දිනය: ............................. ............................................................

**විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව**

ඉහත නිර්දේශය අනුමත කරමි.

දිනය: ............................. ........................................................................

**පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්**

**පාසල් ඉල්ලුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාලව පදිංචිය තහවුරු කිරීම**

1. දිස්ත්‍රික්කය :-................................... 2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-.....................................
3. ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය :- ..................................................................
4. ඉල්ලුම්පතේ සඳහන් සම්පූර්ණ නම :-...............................................................................................
5. උපන්දිනය :-......................................
6. ලිපිනය :- ...........................................................................................................................
...........................................................................................................................
7. පාසලේ නම :- ...................................................................................................................

වෙනත් කරුණු ..............................................................................................................................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් මෙම ඉල්ලුම්කරු ඉහත සඳහන් ලිපිනයේ පදිංචිකරුවෙකු බවත් සහතික කරමි.

............................................. .............................................

ග්‍රාම නිලධාරී අත්සන සහ දිනය ග්‍රාම නිලධාරී නම සහ නිල මුද්‍රාව

---

**පාසල් ඉල්ලුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට අදාලව පදිංචිය තහවුරු කිරීම**

1. දිස්ත්‍රික්කය :-................................... 2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-.....................................
3. ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය :- ..................................................................
4. ඉල්ලුම්පතේ සඳහන් සම්පූර්ණ නම :-...............................................................................................
5. උපන්දිනය :-......................................
6. ලිපිනය :- ...........................................................................................................................
...........................................................................................................................
7. පාසලේ නම :- ...................................................................................................................

වෙනත් කරුණු ..............................................................................................................................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත් මෙම ඉල්ලුම්කරු ඉහත සඳහන් ලිපිනයේ පදිංචිකරුවෙකු බවත් සහතික කරමි.

............................................. .............................................

ග්‍රාම නිලධාරී අත්සන සහ දිනය ග්‍රාම නිලධාරී නම සහ නිල මුද්‍රාව

(පාසල්/පිරිවෙන් විසින් පිටපත් තුනකින් සම්පූර්ණ කල යුතුය)

පුලිදෙ/මෙ/ප්‍රා/14

ආකෘති අංක 14

**පාසල්/ පිරිවෙන් ඉල්ලුම්පත් භාරදීමේ ලේඛනය**

දිස්ත්‍රික්කය :- ........................................................................................................

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ........................................................................................................

පාසලේ/ පිරිවෙනේ නම :- ........................................................................................................

දිනය :- ........................................................................................................

| අනු අංකය | QR ස්ටිකර් අංකය | ඉල්ලුම්කරුගේ නම | උපන් දිනය | අයකරන ලද ගාස්තු | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ඉල්ලුම්පත් ගාස්තුව | කුවිතාන්සි අංකය | දඩ මුදල | කුවිතාන්සි අංකය |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

මුළු ඉල්ලුම්පත් ප්‍රමාණය :.....................

මුද්දර ඇලවූ ලිපි කවර ප්‍රමාණය :............

**ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමි.**

...............................................

විදුහල්පති /නි.විදුහල්පති /පරිවෙණාධිපති

අත්සන හා නිල මුද්‍රාව

දිනය: ................................

**පරීක්ෂා කලේ:-**

................................

සංවර්ධන නිලධාරී නම හා අත්සන

දිනය: ................................

**පරීක්ෂා කිරීමෙන් පසු නැවත භාරගතිමි.**

...............................................

භාරගත් නිලධාරියාගේ නම හා අත්සන

දිනය: ...........................